# 23

සමිඳුනේ සමිඳුනේ ඔබගේ දිවමන් වචනය
පහන් සිලක් වේ මාගේ දෙපයට
ඝණඳුරු මාවත මා සරණා විට
ඔබ විය මාගේ සරණය සැම දින //

ගං ඉවුරේ දියනේ වැජඹෙමිනා
තිසිකලටා තිසිඵල දෙවනා
නෑ මිලිනව යන්නේ ඒ කිසිදා
වේ සුදනන් දිවියද එලෙසා //

සමිඳු නොහඳුනන පව්වූ දනෝ
සුළඟෙ යන බොල් කරල් මෙනා
දුදනන් හා කිසිදා එක් නොවනා
සුදනන් ආසිරි තිති ලබනා //

